10, 12(1), 12(2), 14(1)E

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. }

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2021-02-18

පැමිණිලි පාර්ශවය : ශ්‍රී හෘදය කන්‍යාරාමය විදුහලේ මුස්ලිම් දරුවන්ගේ දෙමාපියන්ගේ සංසදය,
අංක 32, කෝන්ගහ හන්දිය,
ගාල්ල.

වගඋත්තරකරුවන් : 01. අධ්‍යාපන ලේකම්,
දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය,
02 වන මහල, දක්ෂිණපාය,
ලබුදූව, ගාල්ල.

02. විදුහල්පති කන්‍යා සොයුරිය,
ශ්‍රී හෘදය කන්‍යාරාමය විදුහල,
කලුවැල්ල, ගාල්ල.

03. සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ,
කලාප අධ්‍යාපන කාර්යාලය,
ගාල්ල.

පැමිණිලි අංකය : **HRC/2901/19**

**පැමිණිල්ලේ කරුණු ඉදිරිපත් කිරීම :-**

මෙම පැමිණිලිකරුවන් ගාල්ල ශ්‍රී හෘදය කන්‍යාරාමයේ ඉගෙනුම ලබන මුස්ලිම් දරුවන්ගේ දෙමාපියන් පිරිසක් වන අතර, එම පැමිණිලිකරුවන් පවසා ඇත්තේ, මෙම පාසලේ ඉගෙනුම ලබන මුස්ලිම් දරුවන්ගේ මව්වරුන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වෙමින් පවතින බවයි. පැමිණිලිකරුවන් සඳහන් කර ඇත්තේ, 2019.04.21 වන දින ඇති වූ පාස්කු ප්‍රහාර ඛේදවාචකයෙන් පසු ඉහත කී පාසලේ ආරක්ෂක කමිටුව විසින් ගන්නා වූ තීරණයක් අනුව මුස්ලිම් මව්වරුන් පාසල් පරිපාලනය සමඟ අවබෝධයෙන් කටයුතු කර ඇති බවත්, පාසල් පරිපාලනය විසින් මුස්ලිම් මවුවරුන්ගේ ආගමික අධිෂ්ඨානය මත පළඳින සංස්කෘතික ඇඳුම (අබායා) ඉවත් කර සාරි හෝ ඔසරියෙන් පමණක් සැරසී පාසල් කටයුතු වලට සහභාගී වන ලෙස විදුහල්පතිනිය විසින් මුස්ලිම් මව්වරුන්ට දැඩිව බලකර සිටින බවත්ය.


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone } 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

තවද ඉන්පසු 2019.09.10 වන දින දෙමාපිය රැස්වීමක් සඳහා මුස්ලිම් මව්වරුන්ගේ සංස්කෘතික ඇඳුමින් සහභාගී වූවන් හට පාසලට ඇතුළු වීමට නොදී සාරිය හෝ ඔසරිය හැද සිටින අයට පමණක් පාසලට ඇතුළු වීමට විදුහල්පතිනිය නියෝග කළ බවත්, එම නියෝගයට අකමැති වූ මව්වරුන්ගේ දරුවන් හඳුනාගෙන එම දරුවන් මඟින් ඔවුන්ගේ මවුවරුන්ට සාරිය හෝ ඔසරියක් පමණක් ඇද පාසලට පැමිණෙන ලෙසට බලකර සිටි බවත්ය. තවද මෙම මුස්ලිම් මව්වරුන් පළඳින ඇඳුම් පිළිබඳව පවතින ගැටළු ගැන විදුහල්පතිනිය සමඟ සාකච්ඡා කළද විදුහල්පතිනිය විසින් එය ප්‍රතික්ෂේප කරන බවද ඉන් පසුව මෙම ගැටළුව පිළිබඳව පළාත් ලේකම්, වයි. වික්‍රමසිංහ මහතාටද යොමුකළ අතර, ඔවුන්ගෙන්ද නිසි පිළිතුරක් නොලද බවද දන්වා ඇත.

මෙම ගැටළුව මත දැඩි මානසික පීඩනයකින් මුස්ලිම් මව්වරුන් සිටින අතර, එම අවස්ථාවේදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2019(1) අංක දරණ හා 2019.06.26 දිනැතිව නිකුත් කරන ලද චක්‍රලේඛනයේ 4 වන පරිච්ඡේදයට අනුව මුස්ලිම් මව්වරුන්ගේ සංස්කෘතික ඇඳුම (අබායා) මුස්ලිම් මව්වරුන්ගේ මූලික අයිතිවාසිකමක් බවත්, විදුහල්පතිනිය එම අයිතිවාසිකම් දිගින් දිගටම කඩකරමින් සිටින බවත් පවසා ඇත. අදාළ මවුවරුන් විසින් ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශද පැමිණිල්ල සමඟ අමුණා ඇත.

මෙම ගැටළුව පිළිබඳ සොයා බලා ශ්‍රී හෘදය කන්‍යාරාමයේ මුස්ලිම් මව්වරුන්ගේ මූලික අයිතිවාසිකමක් වන ඔවන්ගේ ආගමික අධිෂ්ඨානය මත අදිනු ලබන සංස්කෘතික ඇඳුම (අබායා) ඇඳීමේ අයිතිය ආරක්ෂා කරදෙන ලෙසට කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-

මෙම ගැටළුව පිළිබඳව විධිමත් පරීක්ෂණයක් කිරීම සඳහා පාර්ශවකරුවන් 2019.12.06 වන දින සිතාසි මඟින් කැඳවා ඇති අතර, වගඋත්තරකාර පාර්ශවය එදින පැමිණිල්ල සමඟ අමුණා ඇති ඇමුණුම් 05 ක් ඔවුන් සතුව නොමැති නිසා මෙම පරීක්ෂණය පවත්වාගෙන යාමට අපහසු බැවින් වෙනත් දිනයක් ඉල්ලා ඇත. ඒ අනුව එදිනම අදාළ ඇමුණුම් වගඋත්තර පාර්ශවය වෙත යොමු කර නැවත 2020.01.16 වන දිනට පරීක්ෂණය නියම කර ඇති අතර, එම පරීක්ෂණය සඳහා මෙම ගැටළුවට සෘජුවම සම්බන්ධ පාසලේ විදුහල්පතිනිය සහභාගී වී නොමැත. විදුහල්පතිනිය වෙනුවෙන් නීතිඥ මහතාද මෙම ගැටළුව නිරාකරණය කරගැනීමට සාධනීය පිළිතුරක් ලබාදී නොමැත. එම අවස්ථාවේදී පැමිණිලිකරුවන් ප්‍රකාශ කර ඇත්තේ, මෙම ගැටළුව උග්‍ර මුහුණුවරක් ලබාගෙන ඇති බවත්, විදුහල්පතිනිය මෙම ගැටළුව පිළිබඳව දැඩි මතයක සිටින බවත්, මින් ඉදිරියට පාසල් භූමියට ඇතුල් වීමේදි මව්වරුන්ට සාරි හෝ ඔසරියෙනුත්, පියවරුන්ට කලිසම සහ කමිසයකිනුත් සැරසී පැමිණිය යුතු බවට තීරණය කර ඇති බවත්ය.

පැමිණිලිකරු තවදුරටත් දන්වා ඇත්තේ, විවිධ අවස්ථාවලදී ලිපි මගින් මේ සම්බන්ධයෙන් අධ්‍යාපන බලධාරීන්ව දැනුවත් කළද ඔවුන්ගෙන් ද නිසි විසඳුමක් නොලද බවයි. එම පරීක්ෂණයේ අවසානයේදී පරීක්ෂණ නිලධාරී විසින් වගඋත්තර පාර්ශවයන්ට මෙම ගැටළුව එක්තරා සංස්කෘතියක් පිළිපදින ජනකොටසගේ ඇඳුම පිළිබඳ ප්‍රශ්නයක් බවත්, එම ප්‍රශ්නය එම ජනකොටසකට ඉතා සංවේදී කාරණයක් බවට පත්වීමට ඉඩ ඇති බවත්, මෙම ගැටළුව පිළිබඳ තවදුරටත් ප්‍රමාදවීමකින් තොරව කඩිනමින් විසඳුමක් ලබාදීමට කටයුතු කරන ලෙසත්ය.

**නිරීක්ෂණය :-** -

ශ්‍රී ලංකාව විවිධ ජාතීන් ජීවත්වන රටක් ලෙස රට තුළ විවිධ ආගම් අදහන, විවිධ භාෂා කතාකරන, විවිධ සංස්කෘතීන්හි ජාතින් සහ ජනවාර්ගික කොටස් ජීවත් වෙමින් සිටියි. එම ජාතීන්ගේ සහ ජනවාර්ගික කොට්ඨාශයන්ගේ ආගමික අයිතීන්, සංස්කෘතික අයිතීන්, භාෂා අයිතීන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයෙන් තහවුරු කොට ඇත.

*ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව ප්‍රකාරව 'නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය' වශයෙන් දක්වා ඇත. එම ව්‍යවස්ථාවේ 12(2) අනුව 'කිසිම පුරවැසියෙකුගේ වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේද, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජනය නොවිය යුත්තේය.' වශයෙන් දක්වා ඇත. එමෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 10 ව්‍යවස්ථාව අනුව 'සෑම තැනැත්තෙකුටම තමන් අභිමත ආගමක් ඇදහීමේ හෝ වැළඳගැනීමේ නිදහස' ඇත. එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(ඊ) අනුව 'ස්වකීය සංස්කෘතිය භුක්ති විඳීමේ හා වැඩිදියුණු කිරීමේ අයිතියද' තහවුරු කර ඇත.*

ඉහත කී ව්‍යවස්ථාවට අනුව මෙම රටේ පුරවැසියෙකුට තමන් කැමැති ආගමක් ඇදහීමට තමන් කැමැති සංස්කෘතියක් පිළිපැදීමට අයිතිවාසිකම් ඇත. ඒ අනුව මෙම රට තුළ ජීවත් වන මුස්ලිම් ජාතිකයන් හටද තමන් කැමැති සංවර ඇඳුමකින් සැරසීමට සියළු අයිතීන් ඇති බව තහවුරු වේ. එම අයතීන් උල්ලංඝනය කිරීමට හෝ එම අයිතීන් භුක්ති විඳීමට බාධාවක් කිරීමට කිසිඳු කෙනෙකුට අවසරයක් නොමැත. තමන් කැමැති ඇඳුමකින් සැරසීම පිළිබඳව මින් පෙරද විවිධ අවස්ථාවලදී ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ කතාබහට ලක් වී ඇති අතර, <u>ෆාතිමා ඉසානා සහ මොහොමොඩ් ඉස්රි සාහුල් හමීඩ් එදිරිව නයන තක්ෂිලා පෙරේරා, ජනාධිපති විද්‍යාලය සහ වෙනත් අය</u> **SCFR 97/14** නඩුවේදී මුස්ලිම් සංස්කෘතික ඇඳුම(අබායා) ශ්‍රී ලංකා සංස්කෘතිය අතරද ඉතා ප්‍රසිද්ධ ඇඳුමක් බවට හඳුන්වා දුන් අතර, එම ඇඳුම මුස්ලිම් කාන්තාවන්ට හැඳ සිටීමට සියළු අයිතීන් තිබෙන බවටත්, එම ඇඳුම ඇඳීම තුළ අන් කිසිවෙකුට කිසිඳු හානියක් සිදු නොවන බවටත් තහවුරු වී කර ඇත.

තවද මෙම මුස්ලිම් සංස්කෘතික ඇඳුම පැළඳි මුස්ලිම් මවුවරුන් පාසල් භූමියට ඇතුළු වීම තුළ අනෙකුත් ශිෂ්‍යයින්ගේ හා ගුරුවරුන්ගේ ආරක්ෂාවට තර්ජනයක් එල්ල වී ඇති බවට දක්වා ඇතත්, ඒ පිළිබඳව එම අවස්ථාවේදී හෝ මින් ඉදිරියේදී ආරක්ෂක බලධාරින් විසින් උපදෙස් ලබා දී තිබේද යන්න සොයා බැලීමේදී මෙතෙක් මුස්ලිම් කාන්තාවන්ගේ මෙම සංස්කෘතික ඇඳුම ලංකාවේ ජාතික ආරක්ෂාවට තර්ජණයක් බව කිසිදු තැනක තීන්දුවක් ලබාදී හෝ නිගමනයකට එළඹ නොමැත.

මෙම ගැටළුව මතුවන්නේ 2019.04.21 වන දින සිදුවූ පාස්කු ඉරිදා ප්‍රහාරය සමඟින්ය. එම ප්‍රහාරයෙන් පසුව විදුහල්පතිතුමිය විසින් පාසලේ සියළු දෙමාපියන් අමතා 2019.05.06 දිනැති ලිපියෙන් දරුවන් කැටුව යාමට මව්වරුන් හෝ කාන්තාවන් පැමිණෙන විට සාරිය හෝ පහසුවෙන් අනන්‍යතාවය හඳුනාගතහැකි සුදුසු විනීත ඇඳුමකින් සැරසිය යුතු බවත්, කළුපැහැති අබායා සහ මුහුණ ආවරණ නොපළඳින ලෙසත් ඉල්ලීම් කර තිබූ අතර, එම ඉල්ලීමට ද එම පාසලේ ඉගෙනුම ලබන මුස්ලිම් දරුවන්ගේ මව්වරුන් නිහතමානීව හා අවබෝධයෙන් යුතුව කටයුතු කළ බව පැමිණිලිකරුවන් සිය පැමිණිල්ලෙන් දක්වා ඇත.

මෙම ගැටළුවෙන් පසුව රට තුළ ආන්දෝලනයට පත්වූ මුස්ලිම් කාන්තාවන්ගේ මෙම සංස්කෘතික ඇඳුම පිළිබඳව ද කතිකාවක්ද ඇති වූ අතර, එම කාරණාව පදනම් කරගනිමින් එවකට රාජ්‍ය පරිපාලන හා ආපදා කළමණාකරණ සහ ග්‍රාමීය කටයුතු අමාත්‍යංශය විසින් නිකුත් කරන ලද 13/2019 (1) අංක දරණ සහ 2019.06.26 දිනැති චක්‍රලේඛනයේ 4 වන ඡේදයේ 'සේවාලාභියෙකු ලෙස රජයට අයත් පරිශ්‍රයකට ඇතුළු වීමේදී හෝ රජය මඟින් දෙනු ලබන අවස්ථාවන් ලබා ගැනීමට පැමිණීමේදී සෑම තැනැත්තෙකු තමන් පැහැදිලිව හඳුනාගත හැකි ආකාරයෙන් ඇඳුමකින් සැරසිය යුතු බවට විධිවිධාන පැනවීමට සියළු ආයතන ප්‍රධානීන් වගබලාගත යුතු බව' පැහැදිලිව සඳහන් කර ඇත.

කරුණු එසේ තිබියදී ගාල්ල, ශ්‍රී හෘදය කන්‍යාරාම විදුහලේ විදුහල්පතිනිය විසින් මුස්ලිම් මව්වරුන්ට ඔවුන්ගේ සංස්කෘතික ඇඳුමෙන් පාසල් භූමියට ඇතුළත් වීමට බාධා කිරීම කිසිසේත්ම සාධාරණ නොවන බව නිරික්ෂණය වේ. ඉහත කී චක්‍රලේඛනයේ පැහැදිලිව හඳුනාගත හැකි ආකාරයේ ඇඳුමකින් සැරසී පැමිණිය යුතු බව කියා සිටින අතර, SCFR 97/14 ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවේදී මුස්ලිම් කාන්තාවක් අදින මෙම සංස්කෘතික ඇඳුම (අබාය) ශ්‍රී ලංකා සංස්කෘතියේ කොටසක් බවට පිළිගෙන ඇති අතර, එම ඇඳුම ඇඳීමට කාන්තාවන්ට අයිතියක් පවතින බව පැහැදිලිවම තීන්දුකර ඇත.

තවද හෘදය කන්‍යාරාම විද්‍යාලය, රජයේ පාසලක් බැවින් එම පාසල නඩත්තු කිරීමද, පාසල් ගුරුවරුන්ගේ මාසික වැටුපද, පාසල් ළමුන්ට ලබාදෙන පෙළපොත් සහ නිල ඇඳුම්ද මෙම රටේ ජනතාවගේ බදු මුදල් වලින් පාලනය වන අතර, රජයෙන් හෝ අදාළ අමාත්‍යංශ වලින් විටින් විට නිකුත් කරන අණපනත් රෙගුලාසි පාසල් ප්‍රධානියා විසින් ක්‍රියාත්මක කිරීමට බැඳී සිටියි.

නිගමනය :-

ඉහත කී ගැටළුව පිළිබඳව නිරීක්ෂණය කිරීමේදී, 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ තහවුරු කර ඇති 10, 12(1) සහ 12(2), 14(1) ඊ යන ව්‍යවස්ථාවන්හි සඳහන් වී ඇති මූලික අයිතීන් පැමිණිලි පාර්ශවය සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති අතර, ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SCFR 97/14 නඩුවේ තීන්දුවෙන්ද තවදුරටත් තහවුරු වී ඇති පරිදි මෙම පැමිණිල්ලේ පැමිණිලිකරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

එබැවින් මෙම නිගමනයෙන් වගඋත්තරකාර පාර්ශවය පැමිණිලිකරුගේ සංස්කෘතික අයිතීන් තහවුරු කර ඔවුන් කැමැති ආකාරයේ සංවර ඇඳුමකින් සැරසීමට තිබෙන අයිතිය තහවුරු කරදෙන ලෙසට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2021. 03 .18 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසුයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- ගරු අමාත්‍යතුමා,
බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

B/